# වැවිලි අමාත්‍යාංශය
# ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනය (TRI)
# තේ පර්යේෂණ මණ්ඩලය

# ඇබෑර්තු

තලවකැලේ පිහිටි ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනයේ පවත්නා පහත සඳහන් ඇබෑර්තු පිරවීම සඳහා ශ්‍රී ලාංකික පුරවැසියන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.

## 1. ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී

(වල්පැලෑටි පිළිබඳ විද්‍යාව, ආහාර පිළිබඳ විද්‍යාව, පාංශු ක්ෂුද්‍ර ජීව විද්‍යාව, විශ්ලේෂණ රසායන විද්‍යාව, ජෛවමිතිය / සංඛ්‍යානය, කීට විද්‍යාව හා පිරි සැකසුම් තාක්ෂණය සම්බන්ධ විශේෂඥතාවයෙන් යුත් අයහට ප්‍රමුඛතාව හිමිවේ).

**රැකියා විස්තරය :**

අංශ ප්‍රධානී (HOD) හා ප්‍රධාන පර්යේෂණ නිලධාරී (PRO) ගේ අවම නියාමනය යටතේ පර්යේෂණ ව්‍යාපෘති සැලසුම් කොට ක්‍රියාත්මක කිරීම හා විශේෂඥතා විෂයයන් සම්බන්ධව ප්‍රතිඵල විශ්ලේෂණය කොට දත්ත ඉදිරිපත් කිරීම හා දත්ත එක්රැස් කිරීම හා වාර්තාගත කිරීම සඳහා තාක්ෂණ හා පරීක්ෂණ නිලධාරීන්හට මග පෙන්වීම සමග ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී (SRO) විසින්, HOD, PRO නිලධාරීන්ගේ මගපෙන්වීම යටතේ, අංශයේ තාක්ෂණ පැවරුම් වැඩසටහන් සැලසුම් කිරීමේ වගකීම දරයි.

**බාහිර :**

අ) පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත්, අදාළ වන විෂය සංයෝජනය සහිතව විද්‍යා / කෘෂිකර්ම හෝ ඉංජිනේරු ක්ෂේත්‍රයේ, පළමු පංතිය හෝ දෙවන පංතිය ඉහළ පෙළ සිව් (04) වසරක විශේෂ උපාධියක්.

හෝ

ආ) පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත්, අදාළ වන විෂය සංයෝජනය සහිතව විද්‍යා / කෘෂිකර්ම හෝ ඉංජිනේරු ක්ෂේත්‍රයේ, දෙවන පංතිය පහළ පෙළ සිව් (04) වසරක විශේෂ උපාධියක් සමග අදාළ ක්ෂේත්‍රයේ, අවම වශයෙන් වසර එකක (01) පශ්චාත් උපාධියක්.

හෝ

ඇ) අදාළ වන විෂය සංයෝජනය සහිතව විද්‍යා / කෘෂිකර්ම හෝ ඉංජිනේරු උපාධියක් සමග අදාළ ක්ෂේත්‍රයේ වසර දෙකක (02) පර්යේෂණ පශ්චාත් උපාධියක්.

සහ

ඈ) අදාළ ක්ෂේත්‍රයේ PhD උපාධියක් සමග වසර අටක (08) පර්යේෂණ පළපුරුද්ද තිබිය යුතු අතර, ඉන් වසර දෙකක් (02) පළපුරුද්ද, PhD උපාධිය ලබාගැනීමෙන් පසුව විය යුතුය.

සටහන : පර්යේෂණ ප්‍රකාෂණ එක් එක් විෂයයට අදාළව සතුවීම අමතර සුදුසුකමක් වේ.

**අභ්‍යන්තර :**

අ) PhD උපාධියක් සමග AR 1 කාණ්ඩයේ පර්යේෂණ නිලධාරියෙකු ලෙස අවම වසර හයක (06) සතුටුදායක සේවා පළපුරුද්ද.

හෝ

ආ) M Phil / MSc (වසර 02 ක පර්යේෂණ උපාධියක්) සුදුසුකම් සමග AR 1 කාණ්ඩයේ පර්යේෂණ නිලධාරී ලෙස වසර අටක (08) සතුටුදායක සේවාවක පළපුරුද්ද.

(සැ.යු. ඉහත 'ආ' හෝ 'ඇ' යටතේ සුදුසුකම් ලබන අයදුම්කරුවකු SRO තනතුර සඳහා සුදුසුකම් ලැබීම සඳහා අමතර පර්යේෂණ පශ්චාත් උපාධියක් ලබාගත යුතුය.)

සටහන : එක් එක් විෂයයන් සම්බන්ධ පර්යේෂණ පත්‍රිකා සතුවීම අමතර සුදුසුකමක් වේ.

**වැටුප් පරිමාණය :**

AR 2 (2016) (I) රුපියල් 76,200 – 10X2,000 – රුපියල් 96,200/– (මසකට)

**වයස :**

අවුරුදු 30 ට නොඅඩු විය යුතු අතර, 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන්හට මෙම ඉහළ වයස් සීමාව අදාළ නොවේ.

**තෝරා ගැනීමේ ක්‍රමවේදය :**

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගිනි.

## 2. ජ්‍යෙෂ්ඨ උපදේශක නිලධාරී

**රැකියා විස්තරය :**

උපදේශක හා ව්‍යාප්ති ව්‍යාපෘති සැලසුම් කොට ක්‍රියාත්මක කිරීම, අංශ ප්‍රධානී (HOD), ප්‍රධාන උපදේශක නිලධාරී (PAO) ගේ අවම මාර්ගෝපදේශ යටතේ විශේෂඥතා විෂයයන් සම්බන්ධව ප්‍රතිඵල විශ්ලේෂණය හා දත්ත ඉදිරිපත් කිරීම සහ දත්ත එක්රැස් කිරීම හා වාර්තාගත කිරීම සම්බන්ධව තාක්ෂණ හා ව්‍යාප්ති නිලධාරීන් මෙහෙයවීම, ජ්‍යෙෂ්ඨ උපදේශක නිලධාරී (SAO) වරයා, HOD, PAO නිලධාරීන්ගේ මෙහෙයවීම යටතේ අංශයේ තාක්ෂණ පැවරුම් වැඩසටහන් සැලසුම් කිරීමේ වගකීම දරයි.

**බාහිර :**

අ) පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත්, අදාළ වන විෂය සංයෝජනය සහිතව විද්‍යා / කෘෂිකර්ම හෝ ඉංජිනේරු ක්ෂේත්‍රයේ, පළමු පංතිය හෝ දෙවන පංතිය ඉහළ පෙළ සිව් (04) වසරක විශේෂ උපාධියක්

හෝ

ආ) පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත්, අදාළ වන විෂය සංයෝජනය සහිතව විද්‍යා / කෘෂිකර්ම හෝ ඉංජිනේරු ක්ෂේත්‍රයේ, දෙවන පංතිය පහළ පෙළ සිව් (04) වසරක විශේෂ උපාධියක් සමග අදාළ ක්ෂේත්‍රයේ, අවම වශයෙන් වසර එකක (01) පශ්චාත් උපාධියක්.

හෝ

ඇ) අදාළ වන විෂය සංයෝජනය සහිත විද්‍යා / කෘෂිකර්ම හෝ ඉංජිනේරු උපාධියක් සමග අදාළ ක්ෂේත්‍රයේ දෙවසරක (02) පශ්චාත් උපාධියක්.

සහ

ඈ) අදාළ ක්ෂේත්‍රයේ PhD උපාධියක් සහ අවම වශයෙන් වසර අටක (08) පර්යේෂණ / ව්‍යාප්ති පළපුරුද්ද තිබියයුතු අතර, ඉන් වසර දෙකක් (02) PhD උපාධිය ලබාගැනීමෙන් පසුව විය යුතුය.

සටහන : එක් එක් විෂයයක් සම්බන්ධ ප්‍රකාෂණ සතුවීම අමතර සුදුසුකමක් වේ.

**අභ්‍යන්තර :**

අ) PhD උපාධියක් සමග අවම වශයෙන්, උපදේශක නිලධාරී AR 1 කාණ්ඩයේ, වසර හයක (06) සතුටුදායක සේවා පළපුරුද්ද.

හෝ

ආ) 18 මාසයක M Phil / MSc උපාධියක් සමග උපදේශක නිලධාරී AR 1 කාණ්ඩයේ වසර අටක (08) සතුටුදායක සේවා පළපුරුද්ද.

සැ.යු. ඉහත 'ආ' හෝ 'ඇ' යටතේ සුදුසුකම් ලබන යම් අයදුම්කරුවකු SAO තනතුර සඳහා සුදුසුකම් ලැබීමට අමතර පර්යේෂණ / ව්‍යාප්ති පශ්චාත් උපාධියක් ලබාගත යුතුවේ.)

සටහන : එක් එක් විෂයයක් සම්බන්ධව පර්යේෂණ පත්‍රිකා සතුවීම අමතර සුදුසුකමක් වේ.

**වැටුප් පරිමාණය :**

AR 2 (2016) (I) රුපියල් 76,200 – 10X2,000 – රුපියල් 96,200/– (මසකට)

**වයස :**

අවුරුදු 30 ට අඩුනොවිය යුතු අතර, 45 නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන්හට මෙම ඉහළ වයස් සීමාව අදාළ නොවේ.

**තෝරා ගැනීමේ ක්‍රමවේදය :**

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගිනි.

**වෙනත් ප්‍රතිලාභ :**

i) පවත්නේ නම් නවාතැන් (පූර්ණ ගෘහභාණ්ඩ සහිත නිල නිවාස / නේවාසිකාගාර කාමර) ලබා දිය හැකි අතර, නොඑසේනම්, ඒ වෙනුවෙන් දීමනාවක් ලබා දේ.

ii) ආයතනයේ වෛද්‍ය යෝජනාක්‍රමයෙහි පවත්නා නියමයන් ප්‍රකාරව වෛද්‍ය ප්‍රතිලාභ හිමිවේ.

iii) ආයතනයේ මාර්ගෝපදේශ ප්‍රකාරව හදිසි වෛද්‍ය ප්‍රතිකාර සඳහා නොමිලයේ ප්‍රවාහන පහසුකම් ලබාදේ.

iv) සෑම සති අන්තයකම, පවතින ප්‍රතිපාදන ප්‍රමාණයට අනුව, තලවකැලේ ශාන්ත කූම්බ්ස් සිට කොළඹ හා මහනුවර දක්වා ප්‍රවාහන පහසුකම් සැපයේ.

v) **අර්ථසාධක අරමුදල** : තෝරාගත් අයදුම්කරු විසින්, තම වැටුපෙන් 10% ප්‍රමාණයකින් සේවක අර්ථ සාධක අරමුදල සඳහා දායකවිය යුතු අතර, ආයතනය විසින්, ඒ සඳහා, 15% දායකත්වයක් දරනු ඇත. තවද, ආයතනය විසින්, සේවක භාර අරමුදලටද 3% කින් දායකත්වයක් දරනු ඇත.

vi) තේ පර්යේෂණ ආයතනයේ සේවකයන් සඳහා අදාළ වන අනෙකුත් ආන්තික ප්‍රතිලාභද ලබාදේ.

මෙම තනතුරු ස්ථිරය, සියලු ජීව දත්ත, උප්පැන්න සහතිකය, අදාළ අධ්‍යාපනික හා අනෙකුත් වෘත්තීය සුදුසුකම් සහතික හා සේවා සහතිකවල පිටපත් සමග ඔබගේ නිපුණතා හා අදාළ ක්ෂේත්‍රයේ දැනුම පරීක්ෂා කිරීම සඳහා ඥාති නොවන නිර්දේශකයන් දෙදෙනෙකුගේ විස්තර සහිතව, සකස් කළ අයදුම්පත්, ලියාපදිංචි තැපෑලෙන් පහත සඳහන් අය වෙත, **2022 සැප්තැම්බර් 05 දිනට හෝ ඊට** පෙර ලැබීමට සැලැස්විය යුතුය.

රාජ්‍ය සේවයේ / සංස්ථාවල / ව්‍යවස්ථාපිත මණ්ඩලවල අයදුම්කරුවන්, තම අයදුම්පත්, අදාළ ආයතන ප්‍රධානී මාර්ගයෙන් යොමු කළ යුතුවේ. මෙම අවශ්‍යතාවයට අනුකූල නොවන අයුරින් යොමු කරනු ලබන අයදුම්පත් ප්‍රතික්ෂේප කිරීමට අවකාශ පවතී. එසේම, අදාළ අයදුම්පත් බහාලූ කවරයේ වම් ඉහළ කෙළවරේ අයදුම්කරනු ලබන තනතුර සඳහන් කළ යුතුය.

අමතර තොරතුරු සඳහා, කරුණාකර, තේ පර්යේෂණ ආයතනයේ වෙබ් අඩවිය වන www.tri.lk වෙත යොමුවන්න.

**අධ්‍යක්ෂ,**
**ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනය,**
**ශාන්ත කූම්බ්ස්, තලවකැලේ.**